




## පොසොන් පොහොය දින සිරිලකට
# දයාද කළ අනුභූතිවාදී චින්තනය

මාතර, ශ්‍රී සුදර්ශී විද්‍යායතන නියෝජ්‍ය පරිවෙනාධිපති දෙවිනුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති

ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

පොසොන් පොහොය දින සිරිලකට දයාද කළ අනුභූතිවාදී චින්තනය

ගරු ස්වාමීන්වහන්ස,

පින්වත්නි

අද පොසොන් පුර පසළොස්වක පොහොය දිනයයි. මිහිඳු මහ රහතන් වහන්සේ සිරිලකට වැඩම කළේ විභජ්ජවාදයේ නියෝජිතයෙකු ලෙසටයි. ධර්මාශෝක මහරජතුමා බෞද්ධයෙකු වීමත් සමගම අන්‍ය ආගමිකයින් ලාභාපේක්ෂාවෙන් බුදුසසුනේ පැවිදි වීම නිසා ඇති වූ ශාසනික අභියෝගය හමුවේ රජතුමා මොග්ගලී පුත්ත තිස්ස මහරහතන් වහන්සෙගේ උපදෙස් පරිදි අන්‍ය තීර්ථකයින් හැටදහසක් හඳුනාගෙන ඔවුන් සසුනෙන් බැහැරකොට බුදුසසුන පිරිසිදු කළේ විභජ්ජවාදය යන වචනය පෙරදැරි කරගෙනය.විභජ්ජවාදය යනු බෙදා දැක්වීමයි. ඕනෑම ගැටලුවක් සමස්තය හැටියට තේරුම් ගත නොහැකිනම් එය බෙදා දැක්විය යුතුයි.

පුද්ගලයා යන වචනය තේරුම් ගැනීම ඉතා අපහසුය. එනිසා බුදුන්වහන්සේ එක් තැනකදී නාම රූප වශයෙන් කොටස් දෙකකට බෙදූහ. තවත් තැනකදී රූප - වේදනා - සඤ්ඤා - සංඛාර - විඤ්ඤාණ වශයෙන් බෙදා දැක්වූහ. මේ බෙදීමේදී ආයතන වශයෙන් 12 කටත් ධාතු වශයෙන් 18කටත් බෙදා දක්වා ඇත. මේ බෙදීම විභජ්ජවාදී ක්‍රමයයි. ඒ නිසා බුදුදහම හැඳින්වීම සඳහා මේ විභජජවාදය යන වචනය ඉතාම සුදුසුය.

මිහිඳු මාහිමියන් අද වැනි පොසොන් පෝය දිනක සිරිලකට වැඩමවා චුල්ලහත්ථිපදෝපම සූත්‍රයෙන් දේවානම්පිය තිස්ස රජතුමා ඇතුළු ලක් වැසියන්ට ධර්මය දේශනාකොට ලක්දිව ප්‍රථම මහණ උපසම්පදාව සිදුකළහ. ඒ නිසා මෙවැනි වැදගත් පොහොය දිනයක මෙම සදහම් පණිවිඩයෙන් හඳුන්වා දීමට බලාපොරොත්තුවන්නේ මිහිඳු මාහිමියන් අපට හඳුන්වා දුන් අනුභූතිවාදී චින්තනය හඳුන්වා දීමටයි.

ඇස ආදී ඉඳුරන් මගින් රූපාදී අරමුණු දැක අපි දැනුමක් ඇතිකර ගනිමු. මේ පිළිබඳව විස්තරයක් මජ්ඣිම නිකායේ සඞ්ගාරව සූත්‍රයෙහි එයි. එසේ දැනුම ලබන ක්‍රම හඳුන්වා ඇත්තේ ඥාණමාර්ග යන වචනයෙනි. "අනුසසවික", තකකී වීමංසී, "මොමූහෝ" යන වචන තුනෙන් එදා පැවති ඥාණ මාර්ග තුනක් දක්වා ඒවා ප්‍රතික්ෂේප කොට ඇත.

අප යම් යම් දේ දැනගන්නේ පරපුරෙන් අසා දැනගත්දේ නිසාය. උගත් බුද්ධිමත් කෙනෙක් මෙසේ ප්‍රකාශ කොට ඇත. ඒ නිසා අපිද එය එසේ යයි පිළිගනිමු. මේ ක්‍රමයට කියන්නේ සාම්ප්‍රදායික චින්තනය කියායි. මේ ක්‍රමය සපුරා ප්‍රතික්ෂේප කිරීමක් බුදුදහම තුළ නැත. ඒ නිසා මෙම සාම්ප්‍රදායික චින්තනය හරි වන්නටත් වැරදි වන්නටත් පුලුවන. (අනුස්සවිකා)

සමහරවිට අපි තර්කකොට විමසා බලා දැනුමක් ඇතිකර ගනිමු. එය හඳුන්වන්නේ බුද්ධිවාදී චින්තනය හැටියටයි. එද භාරතයේ පැවති ප්‍රධාන ඥාණ මාර්ගයකි. නමුත් තර්කකොට හරි නිගමනවලට මෙන්ම වැරදි නිගමනවලටද එළඹිය හැක. ඒ නිසා ඒ ක්‍රමයද අවදානම් සහිත ඥාණ මාර්ගයකි. (තකකී වීමංසී)

භාරතයේ ජීවත්වූ සංජය බෙල්ට්ඨි පුත්ත වැනි ආචාර්ය වරුන් මඳ නුවණැති බැවින් අසන ප්‍රශ්න වලින් පැන යමින් තමාට හිතෙන පිළිතුරක් දෙයි. එය අඥෙයවාදය වශයෙන් දැක්වේ. (මොමූහෝ)

අප මෙතෙක් ඉදිරිපත් කළ ඉගැන්වීම් අනුභූතිවාදයට නොගැලපේ. බුදුදහම ඉදිරිපත් කරන අනුභූතිවාදය යනු තමාගේම නුවන මෙහෙයවා ඇතිකර ගන්නාවූ දැනුමයි. (සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති) යනුවෙන් දක්වන්නේ එම අනුභූතිවාදී ඥාන මාර්ගයයි. ධර්මාශෝක මහරජතුමා මොග්ගලී පුත්ත තිස්ස මහරහතන්වහන්සේගේ සහයෝගයෙන් එද සිටි හැටදහසක් පමණ අන්‍යතීර්ථකයින් පලවා හැර බුදු සසුන පිරිසිදු කළේ මෙම අනුභූතිවාදී චින්තනය මත පිහිටා ගෙනය. අද වැනි පොසොන් පොහොය දිනයක සිරිලකට වැඩමකළ මිහිඳු මාහිමියන්ද අපට ධර්මය දේශනා කළේ මෙම අනුභූතිවාදී චින්තනය පෙරදැරි කරගෙනය.

මෙම අනුභූතිවාදී චින්තනයෙන් කෙරෙන්නේ යමක් පිළිබඳව හෝ යමෙක් පිළිබඳව දැනුමක් ලබා ගැනීමට නම් තමා විසින්ම නුවනින් කල්පනාකර එය කළ යුතුබවයි. පරම්පරා වෙන් ආ අදහස් හෝ තර්ක කිරීමෙන් හෝ, නොදන්නාකම ප්‍රදර්ශනය වේය යන බියෙන් හෝ ඒවා නොපිළිගත යුතුයි.

මිහිඳු මාහිමියන් පොසොන් පොහොය දින සිරිලකට වැඩම කරවා සියලු කටයුතු ආරම්භකළේ ඉහතකී අනුභූතිවාදී චින්තනයට අනුවයි. මිහිඳු මාහිමියන් ඉන්දියාවේ වැඩ සිටින විට දේවානම්පියතිස්ස රජතුමා ගැන දැනගෙන සිටින්නට ඇත. බොහෝ දෙනා කළ ප්‍රකාශවලට අනුව එතුමා බුද්ධිමත් පාලකයෙක් යැයි දැනගෙන සිටින්නට ඇත. ඒ දැනීම ඉහත කී සාම්ප්‍රදායික චින්තනයෙන් ඇතිකරගත් දැනීමකි. මිහිඳු මාහිමියන් අඹ ප්‍රශ්නය ඉදිරිපත් කළේ රජතුමා බුද්ධිමත් කෙනෙකුදැයි තමා විසින්ම දැනගත යුතු නිසයි. අනුභූතිවාදීව යමක් පිළිගන්නවා යයි කියන්නේ ඒ ක්‍රමයටයි. රජතුමනි මේ ගස කුමක්ද? ස්වාමීනි අඹ ගසකි. රජතුමනි මේ අඹ ගස හැර වෙනත් අඹ ගස් තිබේද? එසේය ස්වාමීනි. රජතුමනි ඒ අඹ ගසුත් වෙන ගසුත් හැරුනු විට තව ගස් තිබේද? එවිට රජතුමා කීවේ ඇයි ස්වාමීනි මේ අඹ ගස. මේ සංවාදයෙන් සිදුවූයේ කුමක්ද? මිහිඳු මාහිමියන් දේවානම් පියතිස්ස රජතුමා බුද්ධිමත් කෙනෙකු බව අනුභූතියට අනුව තේරුම් ගැනීමයි.

මිහිඳු මාහිමියන් ලක්වැසියනට දේශනා කළ පළමු සූත්‍රය චුල්ලහත්ථිපදෝපම සූත්‍රයයි. බුදුදහම පිළිබඳව නොදන්නා පිරිසක් සඳහා මුලින්ම මේ සූත්‍රය දේශනා කළේ මේ සූත්‍රය තුළ පවත්නා අනුභූතිවාදී චින්තනය හඳුන්වා දීමටයි. තුණුරුවන් ගැන ලක්වැසියා ආරංචියෙන් හා පරම්පරාවෙන් ලබා ගෙන තිබූ දැනුම වඩාත් ශක්තිමත් පදනමක් මත පිහිටියේ මෙම සූත්‍රය නිසාය.

මජ්ඣිම නිකායේ සඳහන්වන චුල්ලහත්ථිපදෝපම සූත්‍රය සඳහන් කරන පරිදි ජාණුස්සෝණි නම් බමුණෙක් සුදුපාට අශ්වයින් යෙදූ රථයකට නැගී නගරය ප්‍රදක්ෂිණා කරයි. ඔහු ඉදිරියට පිලෝතික නම් පරිබ්‍රාජකයෙක් එයි. බමුණා පරිබ්‍රාජකයාගෙන් අසන්නේ ඔබ කොහි සිට එන්නේද? කියායි. මම ශ්‍රමණභවත් ගෞතමයන් වහන්සේ දැක එමියි කීහ. එම බුදුන්වහන්සේ ගැන ඔබ දන්නේ කුමක් දැයි ඇසූවිට ඔහු කීවේ ඥාන පද 4ක් නිසා බුදුන්වහන්සේ ගැන පැහැදී සිටින බවයි. ඒවා විස්තර කරන පරිබ්‍රාජකයා කියන්නේ විවිධ දක්ෂතා ඇති වාදයෙහි දක්ෂ ක්ෂත්‍රිය පඬිවරු, බ්‍රාහ්මණ පඬිවරු, ගෘහපති පඬිවරු, ශ්‍රමණ පඬිවරු බුදුන්වහන්සේ වෙත පැමිණෙති. පැමිණ බුදුන්වහන්සේගේ දේශණා අසා පැහැදී ශ්‍රාවකයින් බවට පැමිණේයයි මම අසා ඇත්තෙමි. ඒ නිසා මමද බුදුන්වහන්සේ ගැන පැහැදී සිටිමි. පිලෝතික පරිබ්‍රාජකයා බුදුන්වහන්සේ ගැන ලබා ගෙන තිබූ දැනුම ආරංචි මාත්‍රය හා තර්කය මත පදනම් වූවකි.

පිලෝතික පරිබ්‍රාජකයා මෙහිදී ඇතාගේ උපමාව දක්වයි. ඇතුන් සෙවීමට කැලයට යන පුරුෂයෙක් එම කැලේ ලොකු ඇතෙකුගේ පා සටහනක් දකී. ඔහු මෙසේ තීරණය කරයි. මෙතරම් විශාල පා සටහනක් දුටුවේ මේ කැලේ විශාල ඇතෙක් සිටිය යුතුයි. එසේම මෙම ඥාන පද හතර නිසා බුදුන්වහන්සේ සම්මා සම්බුද්ධය, ධර්මය සවාකඛාතය සංඝයා සුපටිපනනය යනුවෙන් මම සිතමි. මෙහිදී පිලෝතික පරිබ්‍රාජකයා ආරංචි සහ තර්ක බුද්ධිය මත පිහිටා සිට අනුමානය මත පදනම් වූ දැනුමක් ඇතිකර ගෙන තිබේ. බුදුදහම කියන්නේ අනුමානය හරිවන්නටත් වැරදි වන්නටත් පුලුවන. ඒ නිසා දැනුම ලබන හොඳම ක්‍රමය ප්‍රත්‍යක්ෂයයි. අප මෙහිදී අනුභූතිය කියා කථා කරන්නේ එම ක්‍රමයටයි.

දිනක් ජාණුස්සෝනි බමුණා බුදුන්වහන්සේ වෙත පැමිණ මම ඔබ වහන්සේ ගැන පැහැදී සිටිමි යයි කියයි. තථාගතයන් වහන්සේ බමුණාගෙන් අසන්නේ ඊට හේතු කවරේද කියායි. එහිදී පිලෝතික

පරිබ්‍රාජකයා කීදේ සිහිපත් කරයි. එහිදී බුදුන්වහන්සේ බමුණාට දේශනා කළේ බ්‍රාහ්මණය යමෙක් කී පමණින් හෝ ආරංචිමාත්‍රයෙන් එසේ පිළිගන්නට එපා පිලෝතික කී ඇත් පද උපමාවද අඩුපාඩුකම් සහිතය. මම ඔබට එය නිවැරදිව කියා දෙමි.

ඇතුන් පිළිබඳ දක්‍ෂ පුද්ගලයෙකුට මේ කැලේ ලොකු ඇතෙක් සිටී යයි ආරංචි වෙයි. ඔහු එම ඇතා සෙවීමට කැළයට යයි මඳ දුරක් යන විට විශාල ඇත් පා සටහනක් දකී. මේ පා සටහනට අනුව මේ කැළේ ලොකු ඇතෙක් සිටින්නට පුලුවන. නමුත් විශාල පා සටහන් ඇති වාමනිකා ගෝත්‍රයේ මිටි ඇතුන්ද සිටී. මේ පා සටහන එවැනි ඇතෙකුගේ නම් මේ කැලේ ලොකු ඇතෙක් සිටිය නොහැක. තව ටිකක් ඉදිරියට යන විට විශාල පා සටහන් හා ගස්වල ඉහල කර අතුල්ලා ඇති තැන් දකී. මොහු මෙසේ සිතයි. මේ කැලේ ලොකු ඇතෙක් සිටින්නත් පුලුවන. එසේ නොවන්නත් පුලුවන. ඊට හේතුව උච්චා කාළාරිකා නම් වූ ඇතුන් ඉතා උසය සිහින් සිරුරක් ඇත මේ සළකුණු එවැනි ඇතෙකුගේ නම් මේ කැළේ ලොකු ඇතෙකු සිටිය නොහැක. මොහු තවදුරටත් ඉදිරියට යනවිට ඉතා උස් වූ ගස්වල ඉහලින් දළ ඇණ තිබේ. ඒ සළකුණු දකින මොහු මෙසේ සිතයි. මේ කැලේ ලොකු ඇතෙක් සිටින්නටත් පුලුවන. එසේ නොවන්නත් පුලුවන. ඊට හේතුව ඉතා කෘෂවූ ඉතා උස්වූ දළ ඇති උච්චා කණේරුකා නම් ඇතුන් සිටිනා බැවිනි. මේ සළකුණු එවැනි ඇතෙකුගේ නම් මේ කැලේ ලොකු ඇතෙක් සිටිය නොහැක. තවත් ඉදිරියට යන විට මොහු ඉදිරිපිට විශාල හස්ති රාජයෙක් සිටී. ඒ ඇතා දුටුවිට ඔහු සිතන්නේ මේ කැලේ ලොකු ඇතෙක් සිටී යනුවෙනි. බුදුන්වහන්සේ මේ ඇත් උපමාව විස්තර කොට ජාණුස්සෝනි බමුණාට දේශනා කළේ

බුදුන්වහන්සේ සම්මා සම්බුද්ධය, ධර්මය සවාකඛාතය, සංඝයා සුපටිපන්නය යනුවෙන් සිතිය යුත්තේ ආරංචි මාත්‍රයෙන් නොව එම ගුණ හඳුනාගෙන බවයි. අප මේ හඳුන්වා දෙන්නට උත්සාහ කරන අනුභූතිවාදී චින්තනය යනු මෙයයි.

මිහිඳු මාහිමියන් මෙම සූත්‍රය දේශනා කරමින් ලක්වැසියාට දේශනා කළේ අපි බුදුරජානන්වහන්සේගේ ශ්‍රාවකයෝ වෙමු. ඔබලාට අනුකම්පා පිණිස මෙහි පැමිණියෙමි. අප දේශනා කරන ධර්මය හරිය කියා ඔබට වැටහේනම් පිළිගන්න. එයින් කියවෙන්නේ අනුභූතිවාදී චින්තනය ගැනයි.

අප මේ ඉදිරිපත් කරන සදහම් පණිවිඩය ගිහි පැවිදි අප කාගේත් ජීවිත සරුකර ගැනීමට හේතුවෙයි. අද බොහෝ දෙනා ආරංචි මාත්‍රයට හා තර්කයට මුල් තැන දෙමින් කටයුතු කොට ජීවිතය අවුල් කරගනී. විහාරස්ථානවල වැඩ සිටින සමහර ලොකු හාමුදුරුවන් වහන්සේලා තම ශිෂ්‍ය පුත්‍රයින් සමග හිත් අමනාපකම් ඇතිකරගන්නේ ආරංචි මාත්‍රයෙන් ලබන දැනුම පරම සත්‍යසේ සලකන බැවිනි. පන්සල් වල සමහර දායක දායිකාවන් පංසලේ ලොකු හාමුදුරුවන්ට තොරතුරු සැපයීමට පුරුදුවී සිටිති. එම තොරතුරු සත්‍යනම් ගැටලුවක් නැත. අසත්‍ය තොරතුරු සැපයුවොත් සිදුවන්නේ කුමක්ද? එම පන්සලට හිමිවෙන්නට තිබූ වටිනා මානව සම්පත්තියක් අහිමි වී යාමයි. ඒ නිසා විහාරස්ථානවල වැඩ සිටින ගරු ලොකු හාමුදුරුවන් වහන්සේලා එවැනි ආරංචිවලට නොරැවටී තමාගේම අවබෝධයෙන් කටයුතු කොට තම ශිෂ්‍යපුත්‍රයින් වහන්සේලා ආරක්‍ෂා කරගැනීමට වගබලා ගත යුතුයි. එවැනි බොරු ආරංචි සපයන අය මින් ඉදිරියට එවැනි දේ නොකළ යුතුයි.

ගිහි ගෙදර ගිනි ගෙදරක් යන කථාව බොහෝවිට සත්‍යයකි. එය පරම සත්‍යයක් නොවන්නේ එවැනි ගිනි නැති  ගිහි ගෙවල්ද ඇති බැවිනි. අඹුසැමියන් අතර ඇතිවන ගැටුම් දෙමාපියන් හා දූ දරුවන් අතර ඇතිවන ගැටුම් බොහෝවිට ඇතිවන්නේ මෙම ආරංචි මාත්‍රය සහ තර්ක බුද්ධිය මත ඇතිකරගන්නා ගැටුම් නිසායි. ඒ නිසා කවුරුවත් කියන දේ පරම සත්‍ය ලෙස නොසලකා තමාගේම ඇසට පෙනුනොත් තමාගේම කනට ඇසුනොත් එය පිළිගනිමු. බුදුදහම පිළිබඳවත් එසේ සිතා ක්‍රියා කළ හොත් සියළු දුක් කෙළවර කොට මේ සසර ගමන නතර කළ හැක. එබැවින් මෙම අනුභූතිවාදී චින්තනයට අනුව කටයුතු කොට දෙලොව ජය ගැනුමට අධිෂ්ඨාන කර ගනිමු.